# සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

## තනතුරු පුරප්පාඩු

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ：

| තනතුර | පුරප්පාඩු ගණන |
|---|---|
| පරිගණක දත්ත ක්‍රියාකරු | 04 |
| ව්‍යාපෘති සම්බන්ධීකාරක | 01 |
| පොත් ගබඩා භාරකරු | 01 |

02. *සේවයේ නියුක්ත කිරීම සහ සේවා කොන්දේසි*

මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරු සඳහා හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

වැටුප් කේත අංකය ： MN 01-2016

වැටුප් පරිමාණය ： රු. 27,140- 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540

03. සුදුසුකම් ：

I. අධ්‍යාපන සුදුසුකම් ：

(අ) මාධ්‍ය භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර විෂයයන් 06 කින් සමත්වීම.

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අනෙක් විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක්වත් සමත්ව තිබීම.

සහ

(ඇ) 1. *ව්‍යාපෘති සම්බන්ධීකාරක* - රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 04 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

2. පරිගණක දත්ත ක්‍රියාකරු - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පැය 720කට නොඅඩු පරිගණක පාඨමාලාවක් සම්පූර්ණ කර සහතික ලබා තිබීම.

II. *වෘත්තීය සුදුසුකම්* :පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය/ලඝු ලේඛනය පිළිබඳ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

III. *පළපුරුද්ද* : අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

IV. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

V. *වෙනත් සුදුසුකම්* :
1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

04. *වයස් සීමාව* : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
(දැනට රාජ්‍ය සේවයේ නියුක්තවූවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

05. බඳවා ගැනීමේ ක්‍රමය :
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් නියම කරන පරිදි යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත බඳවා ගනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම් පරීක්ෂා කර බලා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව බඳවා ගනු ලැබේ.

* යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| 3. අතිරේක පළපුරුද්ද | 30 | |
| 4. පරිගණක දැනුම | 15 | |
| 5. ඉංග්‍රීසි භාෂා දැනුම | 15 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

06. අයදුම්පත් පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව A4 (8.27 x 11.69) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර 2019.02.22 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.)

සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා :

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ............................ තනතුර සඳහා ඉල්ලුම් කිරීම**

01. මුලකුරු සමග නම :————.
02. සම්පූර්ණ නම :————.
03. උපන් දිනය :————.
04. වයස (2019.02.22 දිනට) : අවුරුදු :————.; මාස :————.; දින :————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
07. ලිපිනය :————.
08. දුරකථන අංකය :————.

09. අධ්‍යාපන සුදුසුකම් :
i. අ.පො.ස. (සා/පෙළ)

වර්ෂය :————.    විභාග අංකය :————.

| විෂය | ලබා ගත් සාමාර්ථය | විෂය | ලබාගත් සාමාර්ථය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

ii. අ.පො.ස. (උ/පෙළ)

වර්ෂය :————.    විභාග අංකය :————.

| විෂය | ලබාගත් සාමාර්ථය |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

10. වෘත්තීය සුදුසුකම් :

11. පළපුරුද්ද :
මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද , මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකුවන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

02-420